(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 10.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 ජූනි 06 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

**ගරු රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

**ගරු සාගල රත්නායක මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වීරකුමාර දිසානායක මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ධුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු කනක හේරත් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 ජුනි 05 වැනි දින මා විසින් **'ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන)'** නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2017 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2017 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(ii) 2017 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(iv) 2017 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(v) 2017 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා ගාලු උරුමය පදනමේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ව්‍යාපාර හා වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2016 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(iv) 2008, 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සතොස හි වාර්ෂික වාර්තා;

(v) 2016 වර්ෂය සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2016 වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්; සහ

(vii) 2005/2006 සහ 2007 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සතොස හි වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චන්දිම ගමගේ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) (i) වත්තල, ඇවරිවත්ත පාර, අංක 114/34 දරන ස්ථානයෙහි පදිංචි ජේ. කේ. පෙරේරාපුල්ලේ මහතාගෙන් ලැබුණු 2018.01.21 දිනැති පෙත්සම; සහ

(ii) රාගම, කුරුකුලාව, අංක 293/2/ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්. ජී. කේ. ඩී. ටියුඩර් ඇන්තනී මහතාගෙන් ලැබුණු 2018.01.18 දිනැති පෙත්සම

ගරු ජෝන් අමරතුංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මඩපාත, මාකන්දන, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි ඩී. සී. ඒ. එම්. චන්ද්‍රකාන්ති මහත්මියගෙන් ලැබුණු 2018.04.03 දිනැති පෙත්සම; සහ

(ii) කළුතර දකුණ, යටවර හන්දිය, මැදවත්ත, බෙගමුව යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එච්. පබ්ලිස් මහතාගෙන් ලැබුණු 2018.03.23 දිනැති පෙත්සම

ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මඩකලපුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරියේ, අධ්‍යක්ෂ එන්. විමලරාජ් මහතාගෙන් ලැබුණු 2018.02.22 දිනැති පෙත්සම ගරු රවී කරුණානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) මාතලේ, පලාපත්වල, අංක 08, හිල්ටන් ජනපදය යන ලිපිනයෙහි පදිංචි එච්. ජී. කරුණාතිලක මහතාගෙන් ලැබුණු 2018.03.19 දිනැති පෙත්සම;

(ii) උකුවෙල, ගුරලවෙල, මාරුකොන වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. ජී. කාන්ති පුෂ්පලතා මෙනෙවියගෙන් ලැබුණු 2018.03.21 දිනැති පෙත්සම;

(iii) ගලේවෙල, බෙලිගමුව, 286/ඩී, කොස්පොත දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. රණසිංහ මහතාගෙන් ලැබුණු 2018.03.20 දිනැති පෙත්සම; සහ

(iv) ගලේවෙල, වාසල කෝට්ටේ, මැදබැද්ද, කඹරගොල්ල යන ලිපිනයෙහි පදිංචි ආර්. ඩබ්ලිව්. එම්. පී. ජී. එස්. ආර්. කේ. වනසිංහ මහතාගෙන් ලැබුණු 2018.03.21 දිනැති පෙත්සම

ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) තෙලිජ්ජවිල, දිග්ගහවත්ත, "චන්දිමාල්" යන ලිපිනයෙහි පදිංචි ඩී. ආර්. ඒ. හසිත චන්දිමාල් මහතාගෙන් ලැබුණු 2018.03.28 දිනැති පෙත්සම;

(ii) හක්මණ, මුරුතාමුරය, "ආසිරි" යන ලිපිනයෙහි පදිංචි ජී. ඒ. ආර්. සමරනායක මහතාගෙන් ලැබුණු 2018.03.28 දිනැති පෙත්සම;

(iii) පාලටුව, තල්ගහගොඩ, බොරලුගෙදර, "සිරිනි" යන ලිපිනයෙහි පදිංචි එච්. ජී. ආරියදාස මහතාගෙන් ලැබුණු 2018.01.29 දිනැති පෙත්සම;

(iv) ගාල්ල, උළුවිටිකේ, දිවෙල්වත්ත යන ලිපිනයෙහි පදිංචි එම්. කේ. එස්. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2018.03.26 දිනැති පෙත්සම;

(v) දෙනිපිටිය, උඩුකාව, නිදන් උයන, "විරෝශාදී" යන ලිපිනයෙහි පදිංචි පී. කේ. අසංක ප්‍රදීප් මහතාගෙන් ලැබුණු 2018.03.24 දිනැති පෙත්සම;

(vi) අකුරැස්ස, පරදූව, උඩගේගොඩ යන ලිපිනයෙහි පදිංචි පී. සුමනාවතී මහත්මියගෙන් ලැබුණු 2018.03.07 දිනැති පෙත්සම;

(vii) නාවිමන, මාකාවිට, කෝංගහහේන යන ලිපිනයෙහි පදිංචි රානි මංගලිකා සමරසිංහ මහත්මියගෙන් ලැබුණු 2018.03.02 දිනැති පෙත්සම;

(viii) ගාල්ල, උළුවිටිකේ, දිවෙල්වත්ත යන ලිපිනයෙහි පදිංචි යූ. ජී. ඒ. එන්. කාරියවසම් මහතාගෙන් ලැබුණු 2018.03.26 දිනැති පෙත්සම; සහ

(ix) තිස්සමහාරාමය, හල්මිල්ලාව යන ලිපිනයෙහි පදිංචි වයි. එස්. ඩබ්ලිව්. විතාරණ මහතාගෙන් ලැබුණු 2018.03.15 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) මාතලේ, තැන්න, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි එච්. එම්. දුෂ්මන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2017.12.09 දිනැති පෙත්සම;

(ii) පොලොන්නරුව, කදුරුවෙල, කොතලාවල නිවාස, අංක 270, දෙකේ ඇල පාර දරන ස්ථානයෙහි පදිංචි කෝසල සුරංග විමලසිරි මහතාගෙන් ලැබුණු 2018.03.10 දිනැති පෙත්සම; සහ

(iii) හොරොව්පතාන, මරදන්කඩවල, අලුත්වත්ත, සමාධි මාවත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ආර්. ජීවකරත්න මහතාගෙන් ලැබුණු 2018.02.26 දිනැති පෙත්සම

ගරු චන්දිම ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(2)හි සඳහන් පරිදි “පූ. භා. 10.30” යන වචන වෙනුවට “පූ. භා. 9.30” යන වචන යෙදීමෙන් එම ස්ථාවර නියෝගය මෙම සභාවාරය තුළ දී ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය”යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ. භා. 2.44 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

“ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය”යි ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.51 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

“ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය”යි සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.43 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 3 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" ලුහුඬු නාමය. "1 මේ පනත 2018 අංක දරන සාප්පු හා කාර්යාලීය සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.".

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තිය සහ 3 වැනි වගන්තිය සභා සම්මත විය.

නව වගන්තිය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට,—

"මව්කිරි දෙන මව්වරුන් සඳහා මව්කිරි දීමේ විවේක කාල සැලසීම.

18 එ. යම් සාප්පුවක හෝ කාර්යාලයක, ස්ත්‍රී සේවකයකු විසින් වයස එක් අවුරුද්දකට අඩු දරුවකුට මව්කිරි දෙන්නේ නම් , පැය නමයක කාලයක දී, ඇයට අවශ්‍ය පරිදි යම් වේලාවන්හි දී, මව්කිරි දීමේ විවේක කාල දෙකක් සඳහා සේවායෝජකයා විසින් ඉඩ දිය යුතු ය. ඒ දරුවාට කිරි දීම සඳහා ඒ ස්ත්‍රී සේවකයාට ඒ සේවායෝජක විසින් දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් සලසා ඇති අවස්ථාවක එක් එක් විවේක කාලය විනාඩි තිහකට නොඅඩු විය යුතු අතර, දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් එසේ සලසා නොමැති අවස්ථාවක, එක් එක් විවේක කාලය එක් පැයකට නොඅඩු විය යුතු ය. තව ද, එය ලිඛිත නීතියක් යටතේ එම ස්ත්‍රී සේවකයාට ආහාර හෝ විවේකය සඳහා සලසන ලද යම් විවේක කාලයකට අතිරේකව විය යුතු අතර ඇගේ සේවා නියුක්තියේ කාර්ය සඳහා ඒ කාලය ඇගේ සේවා නියුක්තියෙහි ඇය වැඩ කළ කාලය වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

"වගන්තිය දෙවන වර කියවිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය

"ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

නාමය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : ඉංග්‍රීසි පිටපතේ නාමය සංශෝධනය කිරීමට,—

"This Act may be cited as the Shop and Office Employees (Regulation of Employment and Remuneration) (Amendment) Act. "

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, සංශෝධිතාකාරයෙන් ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**7. සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 9 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**8. කල් තැබීම (දහම් පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි , ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි බුද්ධශාසන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.55 ට ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2018 ජූනි 07 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වනතෙක් කල් ගියේය.